තැපැල්පති චක්‍රලේඛ අංක :   04/2026

මගේ අංකය: POST/HQ/OP/IPS/E/DDP/2026
තැපැල් මූලස්ථානය
කොළඹ 10
2026.02.16

නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්/ සංවර්ධන/ පාලන),
ප්‍රධාන ගණකාධිකාරී /ප්‍රධාන ගණකාධිකාරී (මුද්දර)/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියළුම පළාත්බද නියෝජ්‍ය තැපැල්පතිවරුන්,
පාලක (මෙහෙයුම් / විමර්ශන), ජ්‍යෙෂ්ඨ පාලන ලේකම්,(මූලස්ථාන / පළාත්බද),
පාලන ලේකම් ( කාර්ය මණ්ඩල),
අධ්‍යක්ෂ (මුද්දර /පුහුණු)/
අධිකාරී (ම.තැ.හු /සම්බන්ධීකරණ / සැලසුම් සහ සංවර්ධන/ උ.තැ.කා./ අලෙවිකරණ හා පර්යේෂණ/ සැපයුම්)
සහකාර අධිකාරී ( මූලස්ථාන/ ගොඩනැගිලි හා ඉඩම්/ තොරතුරු තාක්ෂණ/ උ.තැ.කා/ විශ්ව තැපැල් සංගම් කටයුතු)
සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන්
සියළුම ගණකාධිකාරීවරුන්
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
සියළුම විමර්ෂණ පරීක්ෂකවරුන්/ගිණුම් පරීක්ෂකවරුන්/ ප්‍රධාන තැපැල් ස්ථානාධිපතිවරුන්
සියළුම ප්‍රධාන උපදේශකවරුන්(තැපැල් අභ්‍යාස ආයතන)
සියළුම තැපැල් ස්ථානාධිපතිවරුන්
සියළුම උප තැපැල් ස්ථානාධිපතිවරුන්

**ඇමරිකා එක්සත් ජනපදය (USA) වෙත Delivered Duty Paid (DDP) හරහා තැපැල් භාණ්ඩ භාර ගැනීම**

2026.02.23 දින සිට නැවත ක්‍රියාත්මක වන පරිදි ඇමරිකා එක්සත් ජනපදය (USA) වෙත පහත පරිදි තැපැල් මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබේ.

පළමු අදියරේ දී සියලුම තැපැල් කාර්යාල වලදී පමණක් USA වෙත භාණ්ඩ භාර ගැනීම සිදු වේ. ඒ අනුව,

**උප තැපැල් කාර්යාල වල දී USA වෙත තැපැල් භාණ්ඩ භාර ගැනීම තාවකාලිකව අත්හිටුවනු ලැබේ.**

**1. කවුළුවේ දී භාර ගැනීම:**

තැපැල් අයිතමයන්හි වර්ගීකරණය අනුව පහත වගුවේ දැක්වෙන පරිදි ගාස්තු අය කෙරේ.

| | අයිතම වර්ගය | USA රේගු බදු (USA Custom Duty) | සේවා සැපයුම් ගාස්තුව (Disbursement Fee) | ප්‍රේශණ ගාස්තු (Remittance Fee) | දේශීය සේවා ගාස්තුව (Local service Charge) |
|---|---|---|---|---|---|
| | | Delivered Duty Paid (DDP) | | | |
| **1.1** | ලිපිලේඛන (Documents) | | | | |
| | I. ප්‍රකාශිත වටිනාකම USD 0 - USD99 දක්වා වටිනාකමක් සහිත ලිපි ද්‍රව්‍ය | අදාළ නොවේ. | අදාළ නොවේ. | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| | II. ප්‍රකාශිත වටිනාකම USD 100 හෝ ඊට වඩා වැඩි වටිනාකමක් සහිත ලිපි ද්‍රව්‍ය | ප්‍රකාශිත වටිනාකම මෙන් 20% | රේගු බදු මුදලෙන් 2.5% | USD 1.49 | රු:160.00 |
| **1.2** | භාණ්ඩ (Merchandise) | | | | |
| | I. ප්‍රකාශිත වටිනාකම USD 0 - USD99 දක්වා වටිනාකමක් සහිත සත්‍ය ත්‍යාග (Pure gift) | අදාළ නොවේ. | අදාළ නොවේ. | USD 1.49 | රු:160.00 |
| | II. ප්‍රකාශිත වටිනාකම USD 100 හෝ ඊට වඩා වැඩි වටිනාකමක් සහිත සත්‍ය ත්‍යාග (Pure gift) | ප්‍රකාශිත වටිනාකම මෙන් 20%. | රේගු බදු මුදලෙන් 2.5% | USD 1.49 | රු:160.00 |
| **1.3** | වාණිජ අයිතම (Commercial Sample) | | | | |
| **1.4** | විකිණීම පිණිස යොමු කරන අයිතම (Sales Of goods) / | ප්‍රකාශිත වටිනාකම මෙන් 20% | රේගු බදු මුදලෙන් 2.5% | USD 1.49 | රු:160.00 |
| **1.5** | නැවත හරවා යවන අයිතම (Returned goods) | | | | |
| **1.6** | වෙනත් (Other) | | | | |

යොමු කරන තැපැල් භාණ්ඩ වල නිවැරදි අන්තර්ගතය හා වටිනාකම සම්බන්ධයෙන් නිවැරදි දත්ත ලබා දීමට පාරිභෝගිකයා දැනුවත් කළ යුතු වේ.

## 2. දත්ත පද්ධතිගත කිරීම :

USA වෙත තැපැල් අයිතම භාර ගැනීමේ දී Local IPS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

ඒ අනුව පහත පියවර යටතේ දත්ත ඇතුළත් කිරීම සිදු කල යුතුය

2.1 පාරිභෝගිකයන් විසින් Local IPS මෘදුකාංගය වෙත දත්ත ඇතුළත් කිරීමක් සහිතව හෝ රහිතව රැගෙන එන භාණ්ඩ Local IPS මාර්ගෝපදේශයේ පරිච්ඡේද අංක 4 පරිදි දත්ත ඇතුළත් කර සම්පූර්ණ කිරීම හා එරට වෙත යැවීමට බලාපොරොත්තු වන සේවාව යටතේ බාකෝඩ් නිකුත් කිරීම.

2.2 අයිතමය යැවීමට බලාපොරොත්තු වන සේවාව අනුව Receive EMS , Receive Letter හෝ Receive Parcel තේරීම.




*Figure 1 : Receive EMS/Letter/Parcel*

2.3 තෝරා ගන්නා ලද සේවාව EMS නම් , **Receive EMS** තේරූ (Click) විට පහත අතුරු මුහුණත තිරයේ දිස් වේ.




*Figure 2:Receive EMS*

2.4 ඒ අනුව ලබා දෙන ලද EMS බාකෝඩය Textboxහි ඇතුලත් කර Search ක්ලික් කල යුතුය




*Figure 3: Search for EMS Barcode*

2.5 ඉන් අනතුරුව තිරයෙහි පහත පරිදි අතුරු මුහුණතක් (Figure 4:Select the Nature of goods)දිස් වන අතර එම අතුරු මුහුණතෙහි සඳහන්ව ඇති පරිදි තැපැල් කිරීමට නියමිත අයිතමයේ වර්ගීකරණය (Nature Of goods) තේරීම සිදු කල යුතුය.

2.5.1 තෝරා ගන්නා ලද අයිතම වර්ගීකරණය අනුව එය ලිපි ලේඛනයක් නම්, Document අයිකනය click කර බර කිලෝ ග්‍රෑම් වලින් සටහන් කල යුතුය




*Figure 4:Select the Nature of goods*



ප්‍රකාශිත වටිනාකම USD 0-USD 99 වන ලිපි ලේඛන සඳහා රේගු බදු අය වීමක් සිදු නොවන බැවින් ගෙවිය යුතු මුළු ගාස්තුව පහත පරිදි තිරයෙහි දිස් වේ.




*Figure 5: Add the weight of item*

ඒ අනුව පහතින් ඇති **Save** Click කර CN 23 කුවිතාන්සි පත්‍රය මුද්‍රණය කල යුතු වේ




*Figure 6: Save and print CN 23 receipt*



2.5.2 අයිතමයේ ස්වභාවය භාණ්ඩ , වාණිජ අයිතම, විකිණීම පිණිස යොමු කරන අයිතම, නැවත හරවා යවන අයිතම හෝ වෙනත් ලෙස කාණ්ඩ වේ නම් එම අයිකන තේරීම.




*Figure 7 : Click for Merchandise,Commercial sample,Sale of goods, Return goods, other*

ඉන් අනතුරුව අයිතමයේ බර ඇතුළත් කල යුතු අතර එම බරට සහ අයිතමයේ ස්වභාවය මත වෙත ගෙවිය යුතු මුලු ගාස්තුව අතුරු මුහුණතෙහි දිස් වේ.




*Figure 8: Save and Print the Receipt*



ඒ අනුව පහතින් ඇති **Save** click කර CN 23 කුවිතාන්සි පත්‍රය මුද්‍රණය කල යුතු වේ

මුද්‍රණය වන CN22 / CN23 පත්‍රිකා පහත පරිදි පැහැදිලි සටහන් සහිත විය යුතුය.

Rev. S N Ceylon Product Pvt Ltd
No.112/C/5, Nilu Garden,
Batuwatta, Ragama 941532250V EMS
11010 Ragama
0710875174 sanjayasubash2013@gmail.com EE455663876LK
Mr Eric Witherspoon
5711 E. Gov. John Sevier Hwy. Knoxville , TN 37924-3604

| | |
|---|---|
| DDP - | 564.40 LKR |
| Service Charge - | 160.00 LKR |
| Postage - | 9,800.00 LKR |
| Total - | 10,524.40 LKR |

37924-3604 Knoxville US
0018653216531 sanjayasubash2013@gmail.com

Dehydrated Papaya ( Spice) 1 0.1 500.00 LKR 090411 LK

0.5 10,311.00 LKR 9,800.00 LKR

*Figure 9: Printed Receipt*

### 3.ගාස්තු අය කිරීම

3.1 තැපැල් ගාස්තුවට අමතරව ඉහත Figure 9 හි පරිදි USA වෙත ගෙවීමට නියම කරනු ලබන Delivered Duty Paid (DDP) ගාස්තු සහ රු:160.00 ක දේශීය මෙහෙයුම් ගාස්තු අය කර ගත යුතු ය.

3.2 ඇමරිකා එක්සත් ජනපදය වෙත යොමු කරන සියළුම අයිතම, යොමු කරන ලද සේවාවට අදාළ බාර්කෝඩ් අංකය සහ ගෙවීම් කරන ලද ගාස්තු සම්බන්ධයෙන් වෙනම USA DDP Payments ලෙස ලේඛණයක් පවත්වා ගත යුතුය.

| දිනය | බාකෝඩ් අංකය | DDP Charge | Service Charge | Remarks |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

3.3 පහත ආදර්ශය පරිදි වන මුද්‍රාවක් තැපැල් භාණ්ඩයෙහි මූණතෙහි සහ CN 22/ CN23 පෝරම වල සියළු පිටපත් වල පැහැදිලිව පෙනෙන ලෙස සටහන් කල යුතුය.

USA DDP Charges Paid
Office of origin :
Accepted by :

### 4. ඇමරිකා එක්සත් ජනපදය වෙත භාරගත් භාණ්ඩ මධ්‍යම තැපැල් හුවමාරුව වෙත එවීම.

මධ්‍ය තැපැල් හුවමාරුව වෙත විදේශ මළු වැසීමේ දී ඇමරිකා එක්සත් ජනපදය වෙත යොමුවන සියළු අයිතම සඳහා අදාළ සියළුම ගාස්තු හා කොන්දේසි සපුරා ඇති බව තැපැල් වැසීම් කරනු ලබන නිලධාරීන් සහ අධීක්ෂණ නිලධාරීන් තහවුරු කළ යුතුය.



**5. ගිණුම්ගත කිරීම**

5.1 තැපැල් කාර්යාලයේදී:

දෛනිකව එකතු වන DDP ගාස්තු හා අනෙකුත් ගාස්තු (Service Charges) වෙන් වෙන්ව සටහන් කර දෛනික ප්‍රේශණ වාර්තාව මගින් දිසා ගිණුම් කාර්යාල වෙත ප්‍රේශණය කල යුතුය.

5.2 දිසා ගිණුම් කාර්යාලයේදී :

i. ඇමරිකා එක්සත් ජනපදය වෙත ප්‍රේශණය වන රේගු බදු මුදල් හා දේශීය සේවා ගාස්තු පහත ආදායම් කේත යටතේ ගිණුම්ගත කළ යුතුය.

| ගාස්තු වර්ගය | කේතය | අංකය |
|---|---|---|
| DDP ගාස්තුව | D | 096 |
| දේශීය සේවා ගාස්තුව | R | 098 |

ii. තැපැල් කාර්යාලවලින් ලැබෙන ඉන්වොයිස් පත්‍ර පරික්ෂා කර ගිණුම් කටයුතු සිදු කිරීමෙන් පසුව R098 යටතේ එම මසට අදාලව වාර්තා කරන ලද ආදායම් සඳහා පහත පරිදි වාර්තාවක් සකස් කර Local IPS System මෘදුකාංගයේ එම මසට අදාළ වාර්තා පිටපතක් සමඟ සෑම මසකම පළමු දින 10 ඇතුළත ගණකාධිකාරී (ආදායම් ) වෙත ඉදිරිපත් කළ යුතුය.

| මාසය | තැපැල් කාර්යාලය | මුදල් පොත අනුව වාර්තා කරන ලද දේශීය සේවා ගාස්තුව (R098) | Local IPS System මෘදුකාංගය අනුව වාර්තා කරන ලද මුදල | වෙනස | හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

5.3 **ගණකාධිකාරී (ආදායම්) කාර්යාලයේදී :**

දිසා ගිණුම් කාර්යාල මගින් මාසිකව යටතේ එම මසට අදාළව වාර්තා කරන ලද ආදායම් සඳහා සවිස්තරාත්මක වාර්තාවක් හා තොරතුරු තාක්ෂණ අංශය මගින් මාසිකව වාර්තාවක් ගෙන්වා ගෙන මාසික ගිණුම් සැසඳුම් වාර්තාවක් පිළියල කල යුතු වේ.

**6. පර්යන්ත තැපැල් කාර්යල වලින් මධ්‍යම තැපැල් හුවමාරුව වෙත ලැබුණු තැපැල :**

මධ්‍ය තැපැල් හුවමාරුව වෙත USA DDP ගාස්තු අය කර ඇමරිකා එක්සත් ජනපදය වෙත යොමු කිරීම සඳහා ලැබෙන සියළුම අයිතම එරට වෙත යොමු කිරීමට පූර්වයෙන් ඉහත කොන්දේසි සපුරා තිබීම සහ CDS පද්ධතියට නිවැරදිව දත්ත ඇතුළත් කර ඇති බවට පරික්ෂා කර තහවුරු කර ගත යුතුය.

අදාල ගාස්තු අය වී නොමැති සියළුම භාණ්ඩ යවන්නා ගෙන්වාගෙන ගාස්තු අය කර ගැනීමට කටයුතු කිරීම හෝ එසේ නොහැකි අවස්ථා වලදී මීළඟ තැපැලෙන් භාරගැනීම් සිදු කරන ලද තැපැල් කාර්යාලය වෙත ලැබීමට සැළැස්විය යුතුය.

ඉහත ගාස්තු හා අනෙකුත් කොන්දේසි වලට පටහැනිව භාර ගැනීම් කර ඇති තැපැල් අයිතම සම්බන්ධයෙන් වාර්තා කළ යුතුය.

විදේශ තැපැල වෙත භාණ්ඩ යොමු කිරීමේ සැළකිලිමත් විය යුතු පොදු කරුණු (තැපැල මගින් ප්‍රවාහනය තහනම් කරන ලද භාණ්ඩ , එරට මගින් තහනම් කරන ලද සහ සීමා කරන ලද භාණ්ඩ ) සඳහා මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් අනුගමනය කල යුතු අතර පාරිභෝගිකයා විසින් භාණ්ඩය යොමු කිරීමට නියමිත සේවාව අනුව අදාළ සේවාවේ ප්‍රමිතීන් අනුගමනය කරමින් භාණ්ඩය තැපැලට යොමු කිරීමට පියවර ගත යුතුය

**7.** ඒ අනුව අංක Post/HQ/OP/IPS/C/25/2025 දරණ 2025/09/10 දිනැති හා අංක Post/HQ/OP/IPS/C/28/2025 දරණ 2025/09/10 දිනැති ලිපි මගින් ඇමරිකා එක්සත් ජනපදය වෙත භාණ්ඩ යැවීම් සම්බන්ධයෙන් වන උපදෙස් සහිත චක්‍රලේඛ 2026/02/ 23 දින සිට අවලංගු වේ.

**8. විමසීම්**

- 1950 - ක්ෂණික ඇමතුම් අංශය
- සහකාර අධිකාරි (විදේශ තැපැල්)
  මධ්‍යම තැපැල් හුවමාරුව

  දු.ක: 112440668 Fax +94112440111
  E-mail as.fgn@slpost.lk
- අධිකාරි (ජාත්‍යන්තර තැපැල් සේවා)
  ජාත්‍යන්තර තැපැල් සේවා අංශය
  දු.ක: 0112320017
  Email – supdt.ips@slpost.lk

එස්.ආර්.ඩබ්ලිව්.එම්.ආර්.පී. සත්කුමාර
තැපැල්පති

එස්. ආර්. ඩබ්. එම්. ආර්. පී. සත්කුමාර
තැපැල්පති

පිටපත්:

1. ලේකම් (සෞඛ්‍ය ජන මාධ්‍ය අමාත්‍යාංශය) - කාරුණික දැන ගැනීම සඳහා.
2. විගණකාධිපති - කාරුණික දැන ගැනීම සඳහා.